සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

12240

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2014
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: ගණිතය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම :- ........................................................................ විභාග අංකය :- ..........................

# I කොටස

- 01 සිට 20 තෙක් ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු ලියන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් හිමි වේ.

(01) පහත සංඛ්‍යාව වචනයෙන් ලියන්න.

682 450

(02) පහත දී ඇති සංඛ්‍යා ආසන්න 10ට වටයා ලියන්න.

(i) 93 (ii) 147

(03) දී ඇති සෘජුකෝණාස්‍රයේ වර්ගඵලය සොයන්න.




(04) නිර්මිත පරිසරයේ වැඩිපුර දැකිය හැකි කෝණ වර්ගය කුමක් ද?

(05) නිමල් සමබර කාසියක් වරක් ඉහළ දමයි. ඔහුට ලැබිය හැකි ප්‍රතිඵල ලියන්න.

(06) දිශාව සොයා ගැනීම සඳහා භාවිත කරන උපකරණයේ නම ලියන්න.

(07) එකතු කරන්න. $\frac{1}{9}+\frac{2}{9}$

(08) පහත සිදුවීම් සඳහා 0 - 10 පරිමාණයට ලකුණු දෙන්න.

(i) නැගෙනහිරින් ඉර පැයීම

(ii) $a=3$ වන විට $a+5$ හි අගය 10 වීම

(09) දී ඇති ත්‍රිකෝණයේ පරිමිතිය සොයන්න.



(10) පහත දී ඇති තල රූප හඳුන්වන විශේෂ නාම ලියන්න.

(i)



....................

(ii)



....................

(11) 5 cm දිග සරල රේඛා ඛණ්ඩයක් නිර්මාණය කරන්න. එය AB ලෙස නම් කරන්න.

(12) A = {10ට අඩු සමචතුරස්‍ර සංඛ්‍යා} නම් A කුලකයේ අවයව ලියන්න.

(13) සවිධි චතුස්තලයක ඇති දාර ගණන හා ශීර්ෂ ගණන ලියන්න.

(i) දාර ගණන

(ii) ශීර්ෂ ගණන

(14) ලීටර 0.5, මිලිලීටරවලින් ලියන්න.

(15) 6 හි සියලු ම සාධක ලියන්න.

(16) කිලෝග්‍රෑම් 2.02, ග්‍රෑම්වලින් ලියන්න.

(17) අනුපාත ලෙස ලිවිය හැකි ඒවා තෝරා යටින් ඉරක් අඳින්න.

(i) මාලා සාමා මෙන් දෙගුණයක් උස ය.

(ii) නිමල් සරත්ට වඩා බරින් අඩු ය.

(iii) පෙරේරාගේ ආදායම සිල්වාගේ ආදායමට වඩා වැඩි ය.

(iv) කමලාගේ වයස විමලාගේ වයසට සමාන ය.

To download past papers visit
www.vajirapani.blogspot.com

(18) පහත ප්‍රගණන ලකුණු මගින් දක්වා ඇති සංඛ්‍යාව ලියන්න.



(19) සමචතුරස්‍රාකාර කාමරයක බිමෙහි වර්ගඵලය $16m^2$ වේ. එම කාමරයේ පැත්තක දිග සොයන්න.

(20) $a^3+b^3=65$ නම් a හා b සඳහා ගැළපෙන අගයන් ලියන්න.

a =

b =

## II කොටස

- පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් ද අනෙක් ප්‍රශ්න සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 11 බැගින් ද හිමි වේ.

(01) (a) ගුරුතුමාගේ / ගුරුතුමියගේ උපදෙස් පරිදි වීජීය ප්‍රකාශන පාඩම ඇසුරින් ඔබ විසින් ඉදිරිපත් කරන ලද භූමිකා රංගනය සිහිපත් කරන්න. එම භූමිකා රංගනය ඉදිරිපත් කිරීමේ දී ඔබ ඒ සඳහා සූදානම් වූ ආකාරය පියවර තුනකින් ලියන්න.

(b) ඉහත භූමිකා රංගනය ඉදිරිපත් කිරීමට සිසුන් සමූහයක් සූදානම් කරගත් කාඩ්පත් සමූහයක් පහත දැක්වේ.

| | | | | |
|---|---|---|---|---|
| $x$ | 3 | b | + | 2 |
| - | y | a | 5 | 1 |

(i) ඉහත කාඩ්පත්වල දක්නට ලැබෙන වීජීය සංකේත ලියන්න.

(ii) ඉහත කාඩ්පත්වල දක්නට ලැබෙන ගණිතමය සංකේත ලියන්න.

(iii) කාඩ්පත්වල දැක්වෙන තොරතුරු **පමණක්** ආධාරයෙන් නිවැරදි ගණිතමය (සංඛ්‍යාමය) සම්බන්ධතා දෙකක් ලියන්න.

(iv) කාඩ්පත්වල දැක්වෙන තොරතුරු **පමණක්** ආධාරයෙන් වීජීය ප්‍රකාශන පහක් ලියන්න.

(02) (a) (i) (-5) සිට (+5) තෙක් විහිදුණු සංඛ්‍යා රේඛාවක් අඳින්න.

(ii) ඉහත ඔබ ඇඳි සංඛ්‍යා රේඛාව මත පහත දැක්වෙන සංඛ්‍යා ලකුණු කරන්න.
(-3) , 0 , (+1)

(iii) ඉහත (ii) හි ඔබ ලකුණු කරන ලද සංඛ්‍යා ආධාරයෙන් සැසඳීම් දෙකක් ලියන්න.

(b) රූපයේ ඉංග්‍රීසි අක්ෂරවලින් දැක්වෙන කෝණ වර්ග නම් කරන්න.




a. ..............................

b. ..............................

c. ..............................

d. ..............................

(03) (a) සුළු කරන්න. (i) $\frac{1}{5} + \frac{9}{20}$ (ii) $\frac{7}{10} - \frac{2}{5}$

(b) පාසලක පැවැත්වූ සහතිකපත් ප්‍රදානෝත්සවයක කාලසටහනේ කොටසක් පහත දැක්වේ.

| | |
|---|---|
| ප.ව. 2.00 | ප්‍රධාන ආරාධිතයා පැමිණීම |
| ප.ව.2.05 | ප්‍රධාන ආරාධිතයා වේදිකාවට කැඳවාගෙන යාම |
| ප.ව. 2.15 | පිළිගැනීමේ කතාව |
| ප.ව.2.20 | සහතිකපත් ප්‍රදානය ඇරඹීම |

ඉහත දැක්වෙන කාලසටහන භාවිත කර පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ප්‍රධාන ආරාධිතයා පැමිණීමට නියමිතව තිබූ වේලාව පැය 24 ක්‍රමයට ලියන්න.

(ii) පිළිගැනීමේ කතාවට වෙන් කර තිබූ කාලය තත්පර කීය ද?

(iii) මෙම උත්සවය අවසන් වූ වේලාව 1650h ද ප්‍රධාන ආරාධිතයා නියමිත වේලාවට පැමිණියේ නම්ද උත්සවය සඳහා ගතවූ කාලය පැය හා මිනිත්තුවලින් සොයන්න.

(c) එදිනෙදා ජීවිතයේ කටයුතු සඳහා දිශා යොදා ගන්නා අවස්ථා දෙකක් ලියන්න.

(04) (a) පහත දී ඇති ප්‍රකාශ සත්‍ය නම් "ස" ද අසත්‍ය නම් "අ" ද ඔබේ පිළිතුරු පත්‍රයේ අදාළ අංක යටතේ ලියන්න.

(i) සෘජුකෝණාස්‍රයක සියලු ම පාද සමාන වේ.

(ii) ඕනෑම ඔත්තේ සංඛ්‍යා දෙකක් එකතු කළ විට පිළිතුර ලෙස ලැබෙන සංඛ්‍යාව ඉරට්ට වේ.

(iii) වෘත්තයක සමමිති අක්ෂ බොහෝ ඇත.

(iv) පළමුවන සංයුක්ත සංඛ්‍යාව 4 වේ.

(v) ඝනකාභයකට මුහුණත් 8 ක් ඇත.

To download past papers visit
www.vajirapani.blogspot.com

(b) (i) 3.12 ගණක රාමුවක දක්වන්න.

(ii) සුළු කරන්න. 9.7 - 4.18

(c) සීනි 3kg ක මිල රු.315කි. සීනි 5kg ක මිල සොයන්න.

(05) (a) නිල ඇඳුම් රෙදි බෙදාදීමේ උත්සවයක් පැවැත්වූ පාසලක ළමුන්ට බෙදාදීම සඳහා ලැබුණු ඇඳුම් පෙට්ටි ගණන පිළිබඳ තොරතුරු පහත වගුවේ දක්වේ. එක් පෙට්ටියක ළමුන් 50කට ප්‍රමාණවත් රෙදි අඩංගුව ඇත. මෙම උත්සවය සඳහා පාසලේ ඉගෙනුම ලබන සියළු ම ළමුන් සහභාගී විය.

| | 1 - 5 ශ්‍රේණි | 6 - 9 ශ්‍රේණි | 10 - 13 ශ්‍රේණි |
|---|---|---|---|
| කමිස රෙදි අඩංගුව තිබූ පෙට්ටි ගණන | 6 | 5 | 4 |
| කලිසම් රෙදි අඩංගුව තිබූ පෙට්ටි ගණන | 6 | 5 | 4 |
| ගවුම් රෙදි අඩංගුව තිබූ පෙට්ටි ගණන | 5 | 7 | 3 |
| ඉතිරි වූ ප්‍රමාණ | කලිසම් රෙදි 22<br>කමිස රෙදි 22<br>ගවුම් රෙදි 41 | කිසිවක් ඉතිරි නොවීය | කලිසම් රෙදි 18<br>කමිස රෙදි 18<br>ගවුම් රෙදි 25 |

(i) පාසලට ලැබුණු මුළු රෙදි පෙට්ටි ගණන කීය ද?

(ii) පාසලේ ඉගෙනුම ලබන ගැහැණු ළමයි ගණන කීය ද?

(iii) පාසලේ ඉගෙනුම ලබන මුළු ළමයි ගණන කීය ද?

(b) 300g හා $1\frac{1}{2}$ kg අතර අනුපාතය සරලම ආකාරයෙන් දක්වන්න.

(06) පාපැදි කර්මාන්ත ශාලාවක මාස 6ක් තුළ නිපදවන ලද පාපැදි සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.




අගෝස්තු මස නිපදවන ලද පාපැදි සංඛ්‍යාව 175කි. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) වැඩි ම පාපැදි සංඛ්‍යාවක් නිපදවා ඇති මාසය කුමක් ද?

(ii) සමාන පාපැදි සංඛ්‍යා නිපදවා ඇති මාස ලියන්න.

(iii) මෙම කාලසීමාව තුළ නිපදවූ මුළු පාපැදි සංඛ්‍යාව සොයන්න.

(iv) යතුරු පැදියක් විකිණීමෙන් කර්මාන්තශාලාව රු.750 ක ලාභයක් ලබයි. මෙම කාලසීමාව තුළ කර්මාන්තශාලාව ලැබූ ලාභය ගණනය කරන්න.

(07) පහත ප්‍රහේලිකාව ඔබේ පිළිතුරු පත්‍රයේ පිටපත් කරගන්න. දී ඇති රුකුල් පද භාවිතයෙන් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.
(එක් කොටුවක ලිවිය හැක්කේ එක් ඉලක්කමක් පමණි)




හරහට

(1) 6 වන සමචතුරස්‍ර සංඛ්‍යාවට 5ක් එකතු කළ විට මෙම පිළිතුර ලැබේ.

(4) 9 ගුණාකාරයකි.

(5) 4, 8, 6, 5 යන ඉලක්කම් හතර ම භාවිතයෙන් ලිවිය හැකි විශාල ම සංඛ්‍යාව මෙය වේ.

පහළට

(2) 36 හි දෙවන බලයේ අගය මෙය වේ.

(3) 50ට වැඩි කුඩා ම ප්‍රථමක සංඛ්‍යාව මෙය වේ.

To download past papers visit
www.vajirapani.blogspot.com

PARCEL NO

LOL.lk BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION · pesuru Prakashana Private Ltd. · Akura Pilot · සමනල දැනුම · සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න